# නර්මෙර් ඵලකයේ කලාත්මක ප්‍රයෝග ඇසුරින් හෙළි වන ඊජිප්තුවේ පූර්ව රාජවංශ අවධියේ ඓතිහාසික කරුණු පිළිබඳ අධ්‍යයනයක්

**ඕ.ජී.එස්.ඒ. රුවන්තිකා**

## Abstract

At some point, the man who lived in the world struggled with nature. Instead, he fought with his people for nature. Since then, the concepts of victory and defeat were formed. The winners celebrated the victory and announced the message to the world. They used different methods for that. The Narmer Palette, which belongs to the pre-dynastic period of Egyptian Civilization, is also a message of such victory. This has been identified as the oldest document found in history. It is also known as the oldest document with a personal name. There are opinions among scholars about its usage. Meanwhile, scholars who have studied other palettes in Egypt, point to this as a device used to mix perfumes. However, there are different opinions about this palette. In here, The ruler engraved on this palette, his historical legend, other characters, the relationship between those characters and events, animal figures, other symbols and characters are studied. The main objective of this study is to identify the historical situation of the contemporary period described by the engravings of the Narmer palette. For that, the source reference method is used by studying previous research on Egyptian Civilization.


මුඛ්‍ය පදඃ ඊජිප්තුව, හයිරකොන්පොලිස්, නර්මෙර්, චිත්‍රාක්ෂර, වාස්තුවිද්‍යාව

## හැඳින්වීම

ලෝකය, මහා පිරමීඩ යන වාස්තුවිද්‍යාත්මක නිර්මාණය ඇසුරින් ඊජිප්තු ශිෂ්ටාචාරය පිළිබඳව හඳුනාගනී. එම ශිෂ්ටාචාරය පාලනය කළ රාජකීයත්වය මැනවින් නිරූපණය කරන මෙම සුවිසල් නිර්මාණ ලෝකයේ පුදුමයන් අතරට ද එක් වී තිබේ. ඊජිප්තුව පර්යේෂකයන්ගේ අධ්‍යයනයට ලක්වන සුවිශේෂී කරුණු කිහිපයකි. පෙර සඳහන් කළ මහා පිරමීඩ මෙන්ම පෞරාණික අවමංගල්‍යය චාරිත්‍ර විධි, මරණය පිළිබඳ සංකල්පය, මරණින් මතු පැවැත්ම, සදාකාලිකත්වය යන සංකල්ප ඒ අතර වේ. මෙම සංකල්ප පිළිබඳ අධ්‍යයනයේ දී එම ශිෂ්ටාචාරයේ වාස්තු විද්‍යාත්මක අංග හා චිත්‍රාක්ෂර යන දෙවර්ගයම මැනවින් උපකාරී වේ. ඊජිප්තු ශිෂ්ටාචාරයේ වාස්තුවිද්‍යාත්මක අංග හා කලා කෘතිවල නිරූපණාත්මක සහ නිරූපණාත්මක නොවන කලාත්මක ප්‍රයෝග ඇසුරින් ඉහත සංකල්ප සහිත සමකාලීන අවධියේ සමාජ ඉතිහාසය අධ්‍යයනය කළ හැකිය. එපමණක් නොව උක්ත කලාත්මක ප්‍රයෝගයන් ඇසුරින් ඊජිප්තු වාසීන්ගේ කලා කෞශල්‍යය පිළිඹිඹු වන බව ද කිව යුතුය. මේ අනුව ක්‍රි.පූ. 3000ට පමණ අයත් වන නර්මෙර් නම් පාලකයෙකුගේ අවධියට අයත් නර්මෙර් නම් ඵලකයේ නිරූපණාත්මක හා නිරූපණාත්මක නොවන කලාත්මක ප්‍රයෝග ඇසුරින් හෙළි වන සමකාලීන ඓතිහාසික කරුණු මෙහිදී අධ්‍යයනය කරනු ලැබේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

හෙරඩෝටස් විසින් ඊජිප්තු ශිෂ්ටාචාරය "නයිල් නදියේ තෑග්ගක්" ලෙසින් හඳුන්වන ලදි. සුදු නයිල්, නිල් නයිල් හා ඇට්බරා යන අතු ගංගාවලින් පෝෂණය ලබන නයිල් නදිය ඊජිප්තු ශිෂ්ටාචාරය සරුසාරවත් භූමි භාගයක් බවට පත් කිරීම එවන් වූ කියමනකට හේතු වන්නට ඇත (Teeter, 2011,26). අප්‍රිකානු මහද්වීපයේ, ලෝකයේ දිගම ගංගාව වන නයිල් නදිය ආශ්‍රිතව පිහිටි මෙම පෞරාණික ශිෂ්ටාචාරය උතුරින් මධ්‍යධරණී මුහුද, දකුණින් සුඩානය, නැගෙනහිරින් රතුමුහුද හා බටහිරින් ලිබියාවෙන් සීමා වී තිබේ.




ඡායාරූප අංක 01 - ඊජිප්තු ශිෂ්ටාචාරය

ඊජිප්තු ශිෂ්ටාචාරයේ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී ප්‍රාග් ඓතිහාසික අවධියේ සිට ඓතිහාසික අවධිය නිමාව තෙක් ඉතා දීර්ඝ වූ කාල පරිච්ඡේදයකි (Teeter, 2011,08). එහිදී ලිඛිත සාක්ෂි සහිත යුගය ක්‍රි.පූ. 3000 පමණ සිට ඇරඹෙන බවට විශ්වාස කෙරේ. ඓතිහාසික යුගය ඇරඹෙන විට ඊජිප්තුව, ඉහළ ඊජිප්තුව හා පහළ ඊජිප්තුව වශයෙන් කොටස් දෙකකට බෙදී තිබිණි. කයිරෝ නගරයේ සිට නයිල් ඩෙල්ටා ප්‍රදේශය දක්වා පහළ ඊජිප්තු ප්‍රදේශය ලෙසිනුත්, එම නගරයේ සිට සුඩානය දක්වා කොටස ඉහළ ඊජිප්තු ප්‍රදේශය වශයෙනුත් හඳුනාගැනේ. විලියම් එම්. ෆිලින්ඩර්ස් පෙට්‍රි මහතා ඇතුළු පුරාවිද්‍යාත්මක කණ්ඩායම ඊජිප්තු ශිෂ්ටාචාරයේ පූර්ව රාජවංශ අවධියේ හා පැරණි රාජධානි අවධියේ පුරාවිද්‍යාත්මක අනාවරණයන් මුල්ම වරට සිදු කිරීම පිළිබඳ ගෞරවය හිමි කර ගනී (Teeter,2011,17-24). ඓතිහාසික අවධියේ ඊජිප්තු ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී එය කොටස් තුනකට බෙදා අධ්‍යයනය කෙරේ.

- පැරණි රාජධානි යුගය (ක්‍රි.පූ. 3100-2181)
- මධ්‍යම රාජධානි යුගය (ක්‍රි.පූ. 2055-1650)
- නව රාජධානි යුගය (ක්‍රි.පූ. 1550-1077)

එහෙත් මෙම යුග අතරවාරයේ අන්තර්කාලීන යුග හා

පරිහාණි යුගය වශයෙන් කාල වකවානු බෙදී පවතී (සෝමදේව සහ තවත් අය, 2016,95-132). ඓතිහාසික අවධියේ දී ඊජිප්තුවේ පාලනය හා සම්බන්ධ සුවිශේෂී චරිතයක් පිළිබඳ අසන්නට ලැබේ. එනම් පාරාවෝ (Pharaoh) යන චරිතය යි. පාරාවෝ යන චරිතය රාජකීයත්වය, දිව්‍යත්වය හා පරමත්වය කැටි වුණු මිහිපිට දෙවියෙකු සේ සැලකීය. සූර්ය දෙවියන්ගේ පුත්‍ර හෝරස් දෙවියා හරහා ඊජිප්තුවේ පරිපාලනයේ හා ආගමික ව්‍යූහයේ ඉහළම නායකයා වූ පාරාවෝවරයාට දේවත්වය ආරෝපණය වූ බවට පිළිගැනේ. එනිසා පාරාවෝ ජීවත්ව සිටින කාලයේ හෝරස්ගේ ප්‍රතිමූර්තිය ලෙසින් සැලකූ අතර, මරණයෙන් පසුව හෙතෙම ඔසිරිස්ගේ ප්‍රතිමූර්තියක් සේ සැලකීය. ඔසිරිස් යනු සූර්ය දෙවියාගේ තවත් පුතෙකි. ඔහු සශ්‍රීකත්වයට අධිපති දෙවියා සේම මරණයට අධිපති දෙවියා ලෙසින් ද හැඳින්වේ. මෙම පාරාවෝවරුන්ගේ මරණින් මතු ජීවිතය උදෙසා පිරමීඩ නම් වූ සුවිශේෂී වාස්තු විද්‍යාත්මක නිර්මාණය ඉදි කෙරිණි. ඊජිප්තු ශිෂ්ටාචාරයේ ඉතිහාසය අධ්‍යයනය කරන්නෙකුට එහි රාජවංශ අනුව ගොඩනැගුණු මෙම ඓතිහාසික අවධිය සේම එහි සිට ආපස්සට විහිදුණු ප්‍රාග් ඓතිහාසික අවධිය දක්වා යුගය අධ්‍යයනය කිරීමට සිදු වේ. ඊජිප්තු කලාවේ විකාශනය අධ්‍යයනය කරන කලා ඉතිහාසඥයන් ද එම මාර්ගයේ ගමන් කළ යුතුය.

ඊජිප්තුවේ සංකීර්ණ සමාජයන් එක්සත් කරමින් පැරණි රාජධානිය බිහි කිරීම යන කාරණය මෙම අධ්‍යයනයයේ දී ඉතා වැදගත් වේ. ඊජිප්තු ඉතිහාසය පිළිබඳව "ඊජිප්ටිකා" නමින් ග්‍රන්ථයක් රචනා කරනු ලැබූ මනෙතෝ නම් පූජකවරයා ඊජිප්තුවේ පාරාවෝවරු පිළිබඳව සම්පූර්ණ නාම ලේඛනයක් සකසා ඇත. ඔහුගේ එම නාමාවලියට හා ටියුරින් පැපිරසයට අනුව ඊජිප්තුවේ පළමු පාරාවෝවරයා වන්නේ මෙනස් නම් පාලකයෙකි. මෙනස් රජු ඉහළ සහ පහළ ඊජිප්තුව එක්සත් කර ප්‍රථම වරට ඒකීය ඊජිප්තු රාජධානියක් ගොඩනැගූ පාලකයා ලෙස ඉතිහාසගත වේ (සෝමදේව සහ තවත් අය,2016,96). නර්මෙර් ඵලකය යනු මෙම කාරණය සනාථ කරන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයකි. ඊජිප්තුව එක්සත් කළ මෙනස් රජු හා මෙම ඵලකයේ සඳහන් නර්මෙර් රජු යනු එක් පාලකයෙක් ලෙස පිළිගැනේ (Bogdanovic,2013,240).

**නර්මෙර් ඵලකය**

නූතනයේ භාවිත කරන "ඵලකය" යන වචනය ඉංග්‍රීසි භාෂාවෙන් හැඳින්වෙන්නේ Palette යනුවෙනි. මෙම වචනය දහඅටවන සියවසේ සිට භාවිත කරනු ලැබූ අතර, එහි සම්භවය සිදු වී ඇත්තේ පහත අයුරිනි.

LATIN
Pala (Shovel)
↓
FRENCH
Pale (Spade)
↓
Palette

(https://www.dailywritingtips.com/palette-vs-pallet-palate)

ඵලකය යන වචනය චිත්‍ර ශිල්පීන් විසින් චිත්‍ර ඇඳීමේ දී වර්ණ මිශ්‍ර කිරීම සඳහා භාවිත කරනු ලබන තුනී වක්‍ර දාර සහිත කුඩා පුවරුවක් හැඳින්වීම සඳහා භාවිත කරනු ලැබේ (https://dictionary.cambridge.org/dictionary/english). මෙය සිත්තරෙකුගේ සායම් ලෑල්ල, වර්ණ ඵලකය ලෙසින් ද හැඳින්වේ (මලලසේකර,1999,626). අප අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වන මෙම නර්මෙර් ඵලකය යනු එසේ වර්ණ ගැන්වීමට සිත්තරෙකු විසින් භාවිත කරන ලද්දක් නොවේ. එසේ වුවද එය නර්මෙර් යන පුද්ගල නාමයට පසුව ඵලකය යන්න යොදා හඳුන්වනු ලැබේ.

නර්මෙර් ඵලකය ක්‍රි.පූ. 3000 දී පමණ ඊජිප්තුව පාලනය කළ නර්මෙර් රජු විසින් හයිරකොන්පොලිස් (Hierakonpolis) නම් ස්ථානයේ පිහිටි හෝරස් රජුගේ දේවාලයට පූජා කරනු ලැබූ සුවඳ විලවුන් මිශ්‍ර කරන ඵලකයක් ලෙසින් හැඳින්වේ (Teeter,2011,145). මෙය මෙම දේවාලය ආශ්‍රිත භූමියේ වැළලී තිබී වසර 5000කට පමණ පසුව සිදු කරනු ලැබූ කැණීම්වල දී හමු වී ඇත. 1897-1898


අතර කාලයේ දී බ්‍රිතාන්‍ය පුරාවිද්‍යාඥයන් වන ජේම්ස් ඊ. ක්විබෙල් (James E. Quibell) හා ක්‍රිස්ටීන් ග්‍රීන් (Christine Green) විසින් හයිරකොන්පොලිස් හි පිහිටි හෝරස් දේවාලය ආශ්‍රිත භූමියෙන් මෙම ඵලකය සොයා ගෙන ඇත. වර්තමානයේ දී එය කයිරෝවේ ඊජිප්තු කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා තිබේ. ඊජිප්තු බලාධිකාරින් විසින් ඉතාමත් සුවිශේෂී නිර්මාණයක් සේ සලකා ආරක්ෂා කරනු ලබන මෙම නිර්මාණය පැරණි අවධියේ ඊජිප්තු ශිල්පීන්ගේ ශිල්පීයත්වයේ ශ්‍රේෂ්ඨත්වය පෙන්නුම් කරයි.

නර්මෙර් ඵලකය පලිහක ස්වරූපය ගනී. මෙය රොන්මඩවලින් සෑදි ඇති ක්ලැස්ටික් අවසාදිත පාෂාණයකින් (SiltStone) නිර්මාණය කර ඇත. සෙ.මී 63.5ක් උස ය. මෙහි ඉහළ කොටසට සාපේක්ෂව පහළ කොටස කුඩා වේ. පළල සෙ.මී 42කි. ඵලකයේ ඉදිරිපස හා පිටුපස අර්ධ උන්නත කැටයම් දක්නට හැකිය. මෙවැනි කැටයම් පසුකාලීන ඊජිප්තු දේවාලවල ද දැකගත හැකිය. උගතුන් විසින් මෙහි අන්තර්ගත මානව රූප, සත්ත්ව රූප, චිත්‍රාක්ෂර හා සම්බන්ධ සිදුවීම් මෙන්ම ක්‍රියාවන් බහුඅර්ථ දක්වන බව විශ්වාස කරනු ලබයි (Teeter,2011,146). සංඛ්‍යාත්මක වශයෙන් ගත් කළ මෙහි මානව රූප විසි පහක් දැකිය හැකි අතර, සත්ත්ව රූප හතරකි. ඒ හැරෙන්නට මානව සහ සත්ත්ව ලක්ෂණ සංකලනය වූ රූප සංඛ්‍යාව හතරකි. කෙසේ වෙතත් නර්මෙර් ඵලකය කිසියම් ඓතිහාසික සංසිද්ධියක් විස්තර කරනවා මෙන්ම කිසියම් ස්මාරකමය, අනුස්මරණීය ගුණයක් ද පෙන්නුම් කරන බව පෙනේ (Teeter,2011,148).



ඡායාරූප අංක 02-නර්මෙර් ඵලකය


පුරාවිද්‍යාත්මක පර්යේෂණවල දී නර්මෙර් ඵලකයට පෙර නිර්මාණය වූ ඵලක ද හමු වී ඇත. ඒවා බොහෝ විට සැරසිලිවලින් තොර වූ අතර, සුවඳ විලවුන් ද්‍රව්‍ය නිපදවීම සඳහා අවශ්‍ය වන ඛනිජ ද්‍රව්‍ය ඇඹරීමට හා කලවම් කිරීමට ගන්නා උපකරණයක් ලෙස භාවිත කර ඇත. එබැවින් නර්මෙර් ඵලකය යනු පූර්ව රාජවංශ යුගයට පෙර අවධියේ සිට පැවත ආ භාවිතාවක සංවිධානාත්මක අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය (Teeter,2011,147).




ඡායාරූප අංක 03 - අභිමුඛය ප්‍රතිමුඛය


නර්මෙර් ඵලකයේ අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ දක්නට ලැබෙන නිරූපණාත්මක හා නිරූපණාත්මක නොවන කලාත්මක ප්‍රයෝග හා ඒ පිළිබඳ ඇති අර්ථනිරූපන මෙසේ ය. එහි අභිමුඛය (Obverse) කොටස් හතරකට බෙදා තිබේ. ඉහළම කොටසේ අං දෙකක් සහිත හිස් දෙකකි. මෙවැනි ම වූ හිස් දෙකක් ප්‍රතිමුඛයේ ඉහළම තීරුවේ ද දැකගත හැකිය. මෙම හිස් දෙකේ නිරූපිත කන්, ගවයෙකුගේ කන් සිහිගන්වන අතර, අනෙකුත් ලක්ෂණ මානවරූපි වේ. මෙම හිස් ගව දෙවඟන (Goddess Bat) නිරූපණය කිරීම පිණිස යොදා ඇති බව කියැවේ (Teeter,2011,148). එම රූප දෙක මධ්‍යයේ ඊජිප්තු චිත්‍රාක්ෂරයන් දැකිය හැකිය. එම Catfish හා Chisel යන සංකේත නිරූපිත චිත්‍රාක්ෂරවලින් නර්මෙර් රජුගේ නාමය අර්ථ ගැන්වෙන බව කියැවේ. රජුගේ ආක්‍රමණශීලි බව Catfish යන සංකේතයෙන්

නිරූපණය කරන බවට මතයකි. (egypt-grammar.rutgers.edu>artifacts>Narmer palette)



ඡායාරූප අංක 04 - අභිමුඛයේ ඉහළ තීරුව

අභිමුඛයේ දෙවන තීරුවේ රජු පෙරහැරකින් ගමන් කරන ආකාරය දක්වයි. මෙහි නර්මේර් රජු පහළ ඊජිප්තුවේ රතු ඔටුන්න පැළඳ සිටී. විචාරකයන් රජුට වම් පසින් පිහිටි ඍජුකෝණාස්‍රාකාර සංකේතය රජුගේ මාළිගාව නිරූපණය කරන බව පවසන අතර, එමඟින් රජු මාළිගයෙන් පිටව යාම සංකේතවත් කරනවා විය හැකි බව පවසයි. රජු නිරුවත් දෙපයින් ගමන් කරන අතර, රජුගේ පාවහන් දරන්නා වම් පසින් නිරූපිතය. රජු පාවහන් රහිතව ගමන් කිරීම මඟින් ඔහු පූජා භූමියක සිටින බව හැඟවේ (Janson,1991,61). රජුට ඉදිරියෙන් රාජකීය පිරිසක් ගමන් කරන බව පෙනේ. රජුට ඉදිරියෙන් ම සිටින තැනැත්තා රජුගේ වැඩිමහලු පුත්‍රයා විය හැකි බවට ද අදහස් කෙරේ. එම රූපයට ඉදිරියෙන් ධජ දරන්නන් හතර දෙනෙකු දැකිය හැකිය. ඔවුන් හෝරස් දෙවියන්ගේ අනුගාමිකයන් ලෙස හඳුන්වයි. (egypt-grammar.rutgers.edu>artifacts>Narmer palette)




ඡායාරූප අංක 05 - අභිමුඛයේ දෙවන තීරුව

මෙම පෙරහැර සහිත අවස්ථාව රෞද්‍ර සිදුවීමක් නිරූපණය කරන බව පැහැදිලි වේ. පෙරහැරට ඉදිරියෙන් සතුරු හමුදාවක විය

හැකි හිස් රහිත, පුද්ගලයන් දස දෙනෙකි. බිම වැතිරී ඇති ඔවුන්ගේ සිරුරුවල වැලමිටි එක්කර ගැටගසා ඇත. ඔවුන් එකිනෙකාගේ දෙකකුල් අතර ඔවුන්ගේ හිස් රඳවා තිබේ. මෙම මෘත ශරීරවලට ඉහළින් පාවෙන යාත්‍රාවක් වැනි සංකේතයකි. එහි මෘත කලේබරයක් වැන්නක් ද දැකගත හැකිය. මෙම සංකේතය හයිරකොන්පොලිස්වල පූර්ව රාජවංශ අවධියේ සුසාන බිත්තියක දක්නට ඇති මිනිසුන්, සතුන් සහ සුදු පැහැති යාත්‍රා සහිත සිතුවම (ක්‍රි.පූ. 3200ට අයත්) සිහි ගන්වයි. එම සිතුවමේ දැකිය හැකි යාත්‍රා අවමඟුල් යාත්‍රා විය හැකි බවත්, එම යාත්‍රාවන් ආත්මය රැගෙන යන වාහනයන් (Vehicle of Soul) ලෙසින් ද හැඳින්විය හැකි බවත් කියැවේ (Janson,1991,60). නර්මෙර් ඵලකයේ දක්වෙන මෙම යාත්‍රාව ද එවැනි අදහසක් නිරූපණය කරන්නක් බව පෙනේ. එසේම මෙම යාත්‍රාවට ඉහළින් මෙන්ම එහි ඉදිරියෙන් ද පක්ෂියෙකු බැගින් කැටයම් කර ඇත.

අභිමුඛයේ තෙවන තීරුව හෙවත් විශාල තීරුව සරසා ඇත්තේ මිථ්‍යා විශ්වාසවල එන සත්ත්ව රූප දෙකකිනි. මෙම ඵලකය සුවඳ විලවුන් සැකසීමට අදාළ ඛනිජ ද්‍රව්‍ය මිශ්‍ර කිරීමට භාවිත කරන ලද්දක් විය හැකි බව පෙර සඳහන් කර ඇත. ඉහත සඳහන් සත්ත්ව රූප දෙක මධ්‍යයේ ඇති වෘත්තාකාර අවකාශය එවැනි කාර්යයක් වෙනුවෙන් වෙන් කළ බව සිතිය හැකිය. සැරසිලිවලින් තොර එහි පිට මායිම Serpopards නමින් හැඳින්වෙන මිථ්‍යා සතුන් ද්විත්වයෙන් නිරූපිතය. සර්පයා සහ කොටියා යන සතුන් ද්විත්වයේ සංයෝගයක් ලෙසින් මෙම මිථ්‍යා සත්ත්ව රූපය නිර්මාණය වී තිබේ. එම සතුන් රූපණය කිරීමේ මූලය මෙසපොතේමියා ශිෂ්ටාචාරයේ ප්‍රතිමා ශිල්පයේ දැකගත හැකිය. මෙම කාරණය ඊජිප්තු ශිෂ්ටාචාරය හා සමකාලීන වෙනත් ශිෂ්ටාචාර අතර පැවති විදේශීය සබඳතා පිළිබඳ ඉඟියක් ලබා දේ. මෙම සතුන් දෙදෙනා සේවකයින් දෙදෙනෙකු විසින් පාලනය කරන ස්වරූපයක් දැකිය හැකිය (Teeter,2011,147). ඇතැම් විචාරකයන්ට අනුව මෙම සතුන් දෙදෙනා එකට වෙළාගෙන සිටින ස්වරූපය මඟින් ඉහළ ඊජිප්තුව හා පහළ ඊජිප්තුව එක්සත් වීම අර්ථවත් කරන බව පැවසේ.




ඡායාරූප අංක 06 - අභිමුඛයේ තෙවන තීරුව

අභිමුඛයේ යටම තීරුවේ අං සහිත බලසම්පන්න ගවයෙකු ගොඩනැගිල්ලක බිත්ති විනාශ කරන ආකාරය දක්වයි. මෙම ගව රූපය මගින් සංකේතානුරූපිව නර්මෙර් රජුව නිරූපණය කරන බවට ද අදහස් කෙරේ. විදේශීය සතුරාට එරෙහි ඔහුගේ ආක්‍රමණශීලි ප්‍රහාරය මෙමගින් සංකේතාත්මකව නිරූපණය කරනවා විය යුතුය. එසේම ගවයා විසින් සතුරෙකු පාගා ගෙන සිටින ආකාරය ද නිරූපිතය. ඒ අනුව සතුරාගේ භූමිය, ඔහුගේ ප්‍රදේශය, ඔහුගේ ජනතාව නර්මෙර් රජු සතු වූ බව ප්‍රකාශ කරන බව පෙනේ. මෙලෙස නර්මෙර් ඵලකයේ අභිමුඛයේ දක්නට හැකි නිරූපණාත්මක හා නිරූපණාත්මක නොවන කලාත්මක ප්‍රයෝග පිළිබඳ විස්තර කළ හැකිය.

ප්‍රතිමුඛයේ තීරු තුනකි. එහි ඉහළ තීරුව අභිමුඛයේ ඉහළ තීරුවට සමාන වේ. දෙවන තීරුවේ ආකර්ශණීය සිදුවීමක් නිරූපණය කරයි. නර්මෙර් රජු තර්ජනාත්මක ස්වරූපයෙන් එක් අතකින් මුගුරක් ඔසවාගෙන සිටී. රජු සිය අනෙක් අතින් දණගසාගෙන සිටින විදේශීය සතුරාගේ හිසකෙස්වලින් අල්ලාගෙන සිටී. සතුරා බල රහිතව භයෙන් තැතිගෙන මාරාන්තික ප්‍රහාරයක් බලාපොරොත්තුවෙන් සිටින බව පෙනේ. සතුරු පාලකයාට ඉහළින් චිත්‍රාක්ෂර දක්වා ඇති අතර, ඒ ඔහුගේ නම විය හැකි බවට අදහස් කෙරේ. ඔහු නයිල් ඩෙල්ටාවේ අධිපති විය හැකිය (egypt-grammar.rutgers.edu>artifacts>Narmer

palette).



ඡායාරූප අංක 07 - ප්‍රතිමුඛයේ හා අභිමුඛයේ රජුගේ ඔටුන්න වෙනස් වන ආකාරය

අභිමුඛයේ මෙන්ම ප්‍රතිමුඛයේත් නර්මෙර් රජුගේ රූපය ඉතා විශාල ආකාරයෙන් දක්වා තිබීමෙන් ඔහුගේ බලසම්පන්න භාවය නිරූපණය කරන බව පෙනේ. මෙහි රජු ඉහළ ඊජිප්තුවේ ඔටුන්න දරාගෙන සිටිනු දැකිය හැකිය. රජුගේ පාවහන් දරන්නා ද ඔහුගේ පසෙකින් සිටී. නර්මෙර් රජුගේ වස්ත්‍රාභරණ ගත් කළ ඍජුකෝණාස්‍රාකාර හැඩැති කෙටි ඇඳුමක් ඇඳ සිටී. එහි පබළු වැනි ද්‍රව්‍යවලින් නිමවන ලද දැලක් ද දැකගත හැකිය. එසේම රජුගේ පිටුපසින් ද ගවයාගේ වල්ගය වැනි යමක් නිරූපිතය (Patch,1995,93-116). රජුගේ ඉදිරියෙන් පැපිරස් පැළෑටි යයි සලකන ශාක මත සිය අතින් අල්ලාගෙන ඇති ලණුවකින් මනුෂ්‍ය හිස් කබලක් දරාගෙන සිටින අලංකාර පිහාටු සහිත උකුස්සෙකුගේ රූපයකි. ලණුව මනුෂ්‍ය හිසේ නාස් මුදුවකට සම්බන්ධ කර ඇත. මෙම පැපිරස් ශාකය හා මනුෂ්‍ය හිස පහළ ඊජිප්තුව නිරූපණය කරන බවටත්, එය දරාගෙන සිටින උකුස්සා හෙවත් හෝරස් දෙවියා ඉහළ ඊජිප්තුවට අධිපති දෙවියා ලෙසින් නිරූපණය වන බවත් කියැවේ. මෙහි හෝරස් දෙවියා හා නර්මෙර් එක හා සමාන බව දක්වයි (Janson,1991,61).

ප්‍රතිමුඛයේ පහළ තීරුවේ නිරුවත් පුරුෂ රූප දෙකක් නිරූපිත අතර, ඒවා විදේශීය ස්වරූපයක් ගනී. ඔවුන් විදේශීය හමුදා නිලධාරින් විය හැකිය. එහි එක් අයෙකුගේ ලිංගේන්ද්‍රිය නිරූපිත අතර, එක් රූපයක ලිංගේන්ද්‍රිය දක්නට නැත. අභිමුඛයේ දක්වා ඇති හිස් රහිත සිරුරුවල ද ලිංගේන්ද්‍රිය නිරූපණය නොවන අතර, යටත් කරගත් පුද්ගලයින් ඊජිප්තුවේ සම්මත චාරිත්‍රානුකූලව යටත් කර බව පෙන්වීමට එසේ නිරූපණය කරන්නට ඇත.

නර්මෙර් ඵලකය අධ්‍යයනයට බඳුන් කරන කලා ඉතිහාසඥයන් එහි ප්‍රතිමුඛයේ හා අභිමුඛයේ දැකිය හැකි මානව රූප, සත්ත්ව රූප මෙන්ම චිත්‍රාක්ෂර ඇසුරින් ඓතිහාසික පුවතක් ගොඩ නැගෙන බව පවසයි. ඒ සඳහා ඔවුන් විවිධ න්‍යායයන් ද ගොඩනඟයි. මෙම සියලු කලාත්මක ප්‍රයෝගයන් සුසංයෝග කළ විට නර්මෙර් නම් පාලකයා විසින් පහළ ඊජිප්තුව හා ඉහළ ඊජිප්තුව ඒකාබද්ධ කර එක්සත් රාජධානියක් ගොඩනැගූ බව කිව හැකිය. මෙම ඵලකයේ දෙපසම අනෙක් මානව රූපවලට වඩා නර්මෙර් රජු ප්‍රමාණාත්මකව විශාලව දක්වා ඇත. එමඟින් රජුගේ බලසම්පන්න භාවය මැනවින් නිරූපණය කරයි. එසේම සමකාලීන ධූරාවලිගත සමාජය පිළිබඳ අදහසක් ලබා දේ (Bogdanovic,2013,241). ඔහු සතුරාට එරෙහිව ආක්‍රමණශීලි ලෙස නැඟී සිටින බව පෙන්වයි. මෙම කාර්යය සඳහා රජුට හෝරස් දෙවියාගේ දිව්‍යමයභාවය මුළුමනින්ම බලපෑ බව මෙහි හෝරස් දේව නිරූපණයෙන් දැකගත හැකිය. මෙම බලසම්පන්න රාජකීයත්වය පිළිබඳ සංකල්පය පැවත එන්නේ පූර්ව රාජ වංශයට බොහෝ ඈත කාලයක සිට බව කිව හැකි සාක්ෂි ද පුරාවිද්‍යාත්මක කැණීම්වලින් හමු වී තිබේ. නාක්දා සංස්කෘතියට අයත් මැටි භාජනයක පාලකයා අත් මුගුරෙන් සිරකරුවන්ට පහර දීම නිරූපණය කිරීම (A Jar from Abydos, Naqada I C Period), හයිරකොන්පොලිස්හි සොහොනක අඳින ලද චිත්‍රයක දැක්වෙන සිදුවීම (Naqada II C Period) ඊට උදාහරණ වේ (Teeter,2011,28).




ඡායාරූප අංක 08 - නාක්දා IC, IIC, III යන අවධීන් තුනෙහිම ජයග්‍රහණය සංකේතවත් කර ඇති ආකාරය

**සමාලෝචනය**

ක්‍රි.පූ. 3000 පමණ වන විට ලෝකයේ බොහෝ සංකීර්ණ සමාජ ගොඩනැගෙමින් පැවතිණි. ඊජිප්තු, මෙසපොතේමියා ආදි ශිෂ්ටාචාර ඊට උදාහරණ වේ. මෙම සංකීර්ණ සමාජවල ජීවත් වූ පුද්ගලයින් ස්වාභාවය යටපත් කර සිය ආධිපත්‍යය ඒ මත සටහන් කිරීම ආරම්භ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බොහෝ වාස්තු විද්‍යාත්මක නිර්මාණ, කලා කෘති බිහි විය. නර්මෙර් ඵලකය යනු එබඳු වූ ජයග්‍රහණය සනිටුහන් කරන අනුස්මරණීය කලා කෘතියකි. ඉහළ ඊජිප්තුව හා පහළ ඊජිප්තුව ඒකාබද්ධ කර නර්මෙර් රජු එහි දිව්‍යමය පාලකයා බවට පත් වීම යන සමකාලීන අවධියේ සිදු වූ ඓතිහාසික සංසිද්ධිය මෙම කලා කෘතියෙන් නිරූපණය වේ. එසේම මෙහි කලාත්මක ප්‍රයෝග අතර වන නිරූපණාත්මක මෙන්ම නිරූපණාත්මක නොවන ප්‍රයෝගයන්ගෙන් ද එම නර්මෙර් රජුගේ ජයග්‍රහණයේ සංසිද්ධිය විදහා දක්වයි. සමකාලීන වෙනත් ශිෂ්ටාචාර අතර පැවති සබඳතා හෙළි කරන, රාජකීය අභිලාෂයන් විදහා දක්වන, ප්‍රදේශාත්මක අයිතිය හා එක්සත්භාවය හඟවන, අනුස්මරණීය වූ, ඉතාම සංකීර්ණ බහු අර්ථ සහිත සුවිශේෂී කලා නිර්මාණයක් ලෙසින් නර්මෙර් ඵලකය හඳුනාගත හැකිය.

ඡායාරූපඃ අන්තර්ජාලය හා Before the Pyramids : The Origins of Egyptian Civilization (Emily Teeter (ed.) ) කෘතිය ඇසුරිනි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Bogdanovic, Jelena (2013) *Art and Architecture*, Architecture Publications, Jowa State University.

Janson, H.W. (1991) *History of Art, Vol I*, Prentice Hall, INC., and Harry N. Abrams, INC., Publishers.

Patch, Diana Craig (1995) A "Lower Egyptian" C*ostume: Its Origin, Development, and Meaning*, Journal of the American Research Center in Egypt, Vol. 32, pp. 93- 116, American Research Center in Egypt.

Teeter, Emily (2011) (ed) *Before the Pyramids: The Origins of Egyptian Civilization*, The Oriental Institute of the University of Chicago, Oriental Institute Museum Publications.

මලලසේකර, ජී.පී. (1999) *ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂය*, සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11.

සෝමදේව, රාජ් ඇතුළු තවත් අය (2016) *ඉපැරණි ලෝක ශිෂ්ටාචාර*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

## විද්‍යුත් මූලාශ්‍රය

(https://www.dailywritingtips.com/palette-vs-pallet-palate/)

(https://dictionary.cambridge.org/dictionary/english)

(egypt-grammar.rutgers.edu>artifacts>Narmerpalette)